# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 28 - 2021 අප්‍රේල්


## වැල්අල වල ඇන්ත්‍රැක්නෝස් පාලනයට සුදුසු වන්නේ ආසාදනය වැලැක්වීමයි....



දේශීය ආහාර ප්‍රියකරන්නන් අතර වැල්අල වර්ග වලට තියෙන්නේ හොඳ ඉල්ලුමක්. ඒ නිසාම මුලදී ගෙවතු බෝගයක් වශයෙන් අල වැලක් දෙකක් වගාකර ගැනීමේ තත්වයෙන් තිබූ සිරිත මේ වනවිට වාණිජ වගාවක් තරමට දියුණුවී ඇති බවක්ද පෙනෙන්නට තිබේ. එකම බෝග ප්‍රභේදයක් ලොකු ගහනයක් ලෙස පවත්වාගෙන යනවිට රෝග හා පළිබෝධ තර්ජනයද ස්වාභාවිකවම ඉහළ යන නිසා වැල්අල වගාකරුවන්ද කෘෂිරසායන ද්‍රව්‍යයන් ඉල්ලා සිටින තත්වයකට පැමිණ ඇත. ඔවුන් බහුලවම වාණිජ ලෙස වගාකරන්නේ ඩයස්කෝරියා අලාටා *(Dioscorea alata)* නමැති ප්‍රභේදයයි. පොදු නම් වලින් කියනවානම් රාජ අල, කොඩොල් ආදී නම් වලින් හඳුන්වන්නේ මෙයයි. මෙහිදී බහුලවම හමුවෙන රෝගය වන්නේ ඇන්ත්‍රැක්නෝස් නමැති දිලීර රෝගය වේ.



**"අලාටා විශේෂය මෙම රෝගයට බෙහෙවින් සංවේදී වෙනවා. ආරම්භයේදී කළු පුල්ලි ස්වභාවයෙන් ඇවිල්ලා අන්තිමට අංගමාරයෙදී වගේ මුළු වැලම විනාශ වෙනවා. පරතරය අඩුකරලා ගහන ඝනත්වය වැඩිකරලා බෝගය හදන නිසා පැතිරීම වැඩියි. ගොවීන් රසායනික පාලනයකට කැමැත්ත දැක්වුවත් අපි නම් නිර්දේශ කරන්නේ රෝගය පැතිරීම අවහිර කරලා කෘෂි රසායනික ද්‍රව්‍ය වලින් තොරව වගා කිරීමක්. අල වැලක් මාස 9 ක් විතර තියෙනවා. ඇන්ත්‍රැක්නෝස් රෝගයත් වැස්ස වැඩි, වායුගෝලයේ ජලවාෂ්ප සාන්ද්‍රණය ඉහල වැනි පරිසර තත්වයන් යටතේදී වැඩිපුර හැදෙනවා. ඉතින් රෝගය උත්සන්න වෙන වාරයක් පාසා දිලීර නාශක යෙදීම ප්‍රායෝගික නෑ. ඒ නිසා රෝගය බෝවීම අවහිර කරමින් වගාව පවත්වා ගැනීම තමයි කල යුත්තේ."**





එසේ පවසන්නේ ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ව්‍යාධි විද්‍යා අංශයේ ප්‍රධාන ව්‍යාධි විද්‍යාඥ ගීතානි වීරරත්නයි. ඇය පවසනා පරිද්දෙන් රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා කරන අල කැබලි හරහා වගාවට රෝගය පැමිණිය හැකිවීම රෝග බෝවීමේ පළමු අවස්ථාව වේ. රෝග ලක්ෂණ ප්‍රකාශවන්නේ වර්ධක ශාක කොටසේ නිසා බාහිර පාර්ශවයකින් පැලකිරීම සඳහා ලැබෙන අල කැබලිවල තත්වය පිටතින් බලා තීරණයක් ගත නොහැකිවේ. දැව අළු හෝ අළුහුණු වැනි යමක් ආලේප කිරීමේ සිරිතක් ගොවීන් අතර තිබුනත් ඒ මගින් වැළකෙන්නේ අල කුණුවීම වැනි තත්වයක් මිස ඇන්ත්‍රැක්නෝස් රෝග කාරකයා නැසී යාම ඉන් සිදුවන්නේ නැත.




මේ නිසා වඩාත් ආරක්ෂිත පියවරක් වන්නේ හෝමායි හෝ තිරාම් වැනි දිලීර නාශක දියරයක ගිල්වා තබන ලද අල කැබලි ක්ෂේත්‍රයේ සිටුවීමයි. සිටුවන භූමියේ තිබුණු පෙර වගා ගැනද සැලකිලිමත් විය යුතුය. දිගින් දිගටම එකම භූමියක වැල්අල වගාකිරීම දිලීරයේ ස්ථායී පැතිරීමට උපකාරයකි. ඒ නිසා බෝග මාරුව වෙත පිවිසිය යුතුය. මෙහිදී ඇන්ත්‍රැක්නෝස් නොසැදෙන බඩඉරිඟු වැනි බෝගයක් සමග වසර තුනක්වත් ඉදිරියට යායුත්තේ දිලීරයේ රෝග කාරක අවශේෂයන් වසර තුනක් පමණ දක්වා පස තුල පැවතිය හැකි බැවිනි. මෙම රෝගයට වඩාත් සංවේදී වන්නේ අලාටා විශේෂය බැවින් එක දිගට එය නොවවා, කුකුලල ප්‍රභේදයන් *(Dioscorea esculenta)* වෙත යොමුවීමද රෝග පාලන විකල්පයකි. එහෙත් ගොවීන් අලාටා වෙතම යොමුවන්නේ එහි ඇති අපනයන විභවය හේතුවෙන්ය. පෙර පැවති වගාවන්හි බෝග 'සුන්බුන්' ද ඉවත්කර වගාබිම පිරිසිදුව තබාගනීමටද අමතක නොකළ යුතුය.

**"වාණිජ මට්ටමෙන් වගාකරන කොට වැඩි වැල් ගණනක් පවත්වා ගැනීමට ගොවීන් විසින් නිසි පරතරය නොතබා වගා කරනවා. රෝගය සහිත පත්‍ර මතට වැටෙන වැහි බිංදු සමග ඉවතට විසිවෙන දිලීර බීජානු නිරෝගී පත්‍ර මත**



**රැඳීමේ හැකියාවත් එතකොට වැඩියි. තවත් කෙරෙන අතපසුවීමක් තමයි ලපටි වැල් වලට ආධාරක සැපයීම පමා කරමින් වැඩි කාලයක් ඒවා පොලොව මත තැබීමට කටයුතු කිරීම. මේ නිසාත් පස මතුපිට තිබෙන දිලීර වලින් බෝගය අසාදනය වෙනවා. භූමියේ වල්පැල මර්දනයත් නිසිපරිදි කරන්න වෙයි. වල්පැල වලත් දිලීරය පවතිනවා."**

කෘෂි රසායනික ද්‍රව්‍යයන්ගෙන් තොරව වගාවක් පවත්වා ගැනීමට ගතයුතු පියවරයන් ගීතානි මහත්මිය තවදුරටත් විස්තර කරනු ලැබුවේ එලෙසිනි. කලකට ඉහතදී වගාවන්හි තිබූ වැල්අල ප්‍රභේදයන් රෝගයනට මෙතරම් සංවේදී නොවන්නට ඇත්තේ ඒ අතර ශක්තිමත් ප්‍රභේද විවිධත්වයක් තිබුන නිසා විය හැකිය. එහෙත් මේ වනවිට වාණිජකරණයට හසුවී, ගොවීන් විසින් ප්‍රභේද තෝරාගැනීමත් ඊට සමගාමීව විවිධත්වයේ හායනය හා පටුවීමත් නිසා රෝග සංවේදීතාවය සැලකියයුතු තරමින් වැඩිවී ඇති බවක් පෙනෙන්නේය. ඒ නිසා නොවැලක්විය හැකිනම් පමණක් පැල කුඩා කාලයේදී සහ අහිතකර වැසි සහිත කාලයකට හසුවන්නේ නම් වැලෙහි වයස මාස තුනක් පමණ වනතෙක් සති 3 කට පමණ වරක් (එනම් සිව් වතාවක් පමණ) ඇන්ත්‍රැක්නෝස් සඳහා නිර්දේශිත දිලීර නාශකයක් යෙදිය හැකි බවද ව්‍යාධි විද්‍යාඥවරිය පෙන්වා දෙයි.

**පිටපත : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**

**තාක්ෂණික කරුණු : ගීතානී වීරරත්න - ප්‍රධාන ව්‍යාධි විද්‍යාඥ, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ් .එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)